ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2015
------------------------------------------------------

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ (432 අධිකාරියේ) 5 සහ 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම
--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ , ආදායම් වියදම් ගිණුමේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

## 2.1 මතය ව්‍යාවනය
-----------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
--------------------------------------

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වයඹ, දකුණ, නැගෙනහිර, උතුරු මැද, ඌව හා උතුර යන පළාත්වල දායක මුදල් අරමුදලට බැර වී නොතිබූ අතර ඒවා ලැබිය යුතු දායක මුදල් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් මුදල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂයෙන් ගෙවනු ලබන අතර, එකී වියදම හඳුනාගෙන අරමුදලේ ලැබීම් හා ගෙවීම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**2015 වර්ෂයේදී අරමුදල් ගිණුමට බැර කරන ලද රු. 46,826,453 ක් වූ මුදල ගුරු වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු හෝ දායක විශ්‍රාම වැටුප යන ඒවායෙන් කුමන දායකත්වයන් සඳහා ලද මුදල්ද යන්න නිශ්චිතව හඳුනාගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.**

**2.2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව පනවන ලද නියෝග අංක 9 (අ) | එක් එක් ආධාර මුදල් ගෙවන්නන්, ආණ්ඩුව විසින් අරමුදල සඳහා ගෙවන ලද සියළු ආධාර මුදල් හා ආධාර මුදල් ගෙවන්නෙකුගේ මරණයේදී ඔහුට ගෙවිය යුතුව තිබෙන ආධාර මුදල් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන පවත්වා ගත යුතු වුවත්, එවැනි ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04.1 (අ) ඡේදය | වාර්ෂික අයවැය ලේඛනය විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි සංග්‍රහය 205 | ආදායමින් ආපසු ගෙවීම දෙවරක් ගෙවීම වළක්වනු සඳහා ආරක්ෂණ විධිවිධාන යටතේ ආදායමින් ආපසු ගෙවීම් සම්බන්ධ ලේඛන පවත්වා ගත යුතු වුවත් ඒ අනුව දායක මුදල් ආපසු ගෙවීම් පිළිබඳ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.89,644,498 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.120,273,433 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 30,628,935 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ දායක මුදල් ආපසු ගෙවීම් රු. 4,997,283 කින් එනම් සියයට 58 කින් පහළ ගිය ද, දායක මුදල් ලැබීම් රු. 26,817,769 කින් එනම් සියයට 35 කින් පහල යාම හා පොළී ආදායම රු. 7,224,896 කින් එනම් සියයට 14 කින් පහළයාම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. කෙසේ වුවද 2.2.1 ඡේදයේ සඳහන් ගිණුම්කරණ අඩුපාඩු මතද මෙම මූල්‍ය ප්‍රතිඵලය වෙනස් වනු ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය
--------------------------

### 4.1 කාර්යසාධනය
----------------

1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත ප්‍රකාර ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල් මඟින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කළ යුතු වුවත්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් උක්ත වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂය තුළ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව, අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව සහ සාමාජිකයින්ගේ නම, පාසල ඇතුලත් උපලේඛනයන් නඩත්තු නොකිරීම නිසා අරමුදලට ලැබිය යුතු මුදල, ලද මුදල හා හිඟ මුදල් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය කර ගැනීමට නොහැකි විය.

(ආ) පාසල් 70 කින් ලැබිය යුතු දායක මුදල් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) දායක මුදල් ආපසු ගෙවීමේදී දායකයාගෙන් අයකරගත් මුදල් ප්‍රමාණය වර්යා සටහන පරීක්ෂා කර ගෙවීමට කටයුතු කළද, එම මුදල් නිවැරදිව අරමුදල සඳහා ලැබුණේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ප්‍රධානතම මෙහෙයුම් කාර්යය වන ගුරු වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් වියදම, අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

(ආ) අරමුදලේ දායක මුදල් ලැබීම, දායක මුදල් ආපසු ගෙවීම හා ආයෝජනය මත බදු ගෙවීම යන අයිතම්වල අයවැයගත අගය හා තථ්‍ය අගය අතර පිළිවෙලින් සියයට 44, සියයට 52 හා සියයට 29 ක විචලතාවයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂයේදී හා ඊට පෙර වර්ෂවලදී අරමුදල් කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු වන පරිදි ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබීම. |
| (ආ) | සාමාජිකයන්ගේ කේවල ගිණුම් පවත්වා ගැනීම. | සාමාජිකයන්ගේ කේවල ගිණුම් පවත්වා නොගැනීම. |
| (ඇ) | දායක මුදල් කළමනාකරණය | ගුරු විශ්‍රාම අරමුදලට අදාල දායක මුදල් හා ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායක මුදල් වෙන් වෙන්ව හඳුනාගනිමින් මෙම අරමුදලට අදාල දායක මුදල් ගිණුම්ගත කර නොතිබීම. |